# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1860/3 - 2014 අප්‍රේල් මස 28 වැනි සඳුදා - 2014.04.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/14/23/2006.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

අංක 1848/25 දරන හා 2014.02.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් කුරුවිට, මලව, වළඳුර පාර,රොක් බ්‍රිජ් වත්ත, ලොට් අංක 01හි පදිංචි ටී. ඒ. මුහන්දිරම් මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, පැලවත්ත, පාර්ලිමේන්තු පාර, අංක 70හි පිහිටි කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය අතර පැවති කාර්මික ආරවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති A 3248 දරන හා 2014.01.02 දිනැති ප්‍රදානය අවලංගු කරන ලෙසට කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙතින් කාර්මික ආරවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3248 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2015.02.06 දින සිට අවසන් වන බවට පනතේ 20 (2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2014 අප්‍රේල් මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**'අ' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
2014.03.18 දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2014 පෙබරවාරි මස 06 වන දින අංක 1848/25 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද, ටී. ඒ. මුහන්දිරම් සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය බැඳී සිටින්නා වූ ද, 2014 ජනවාරි 02 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නොඑල් පද්මසිරි කාරියවසම්,
සභාපති,
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත,
බත්තරමුල්ල.

පිටපත : ටී. ඒ. මුහන්දිරම් මහතා,
ලොට් අංක 01,
රොක්බ්‍රිජ් වත්ත, වළඳුර පාර,
මලව, කුරුවිට.

05 - 379

1 A – G 19475 — 75 (2014/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය : IR/21/25/2009.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.08.26 දිනැති හා අංක 1720/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.07.16 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රත්නපුර, නව නගරය, අංක 28/1, සබරගමු ප්‍රාදේශීය කාර්යාලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හි පිහිටි ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි නිලධාරීන්ගේ සංගමය හා අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, පැලවත්ත, පාර්ලිමේන්තු පාර, අංක 70හි පිහිටි කුඩා තේවතු සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.02.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2014 අප්‍රේල් මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/21/25/2009.

කාර්මික අධිකරණයේදී ය.

ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි
නිලධාරීන්ගේ වෘත්තීය සංගමය,
කුඩා තේවතු සංවර්ධන අධිකාරිය,
සබරගමුව ප්‍රාදේශීය කාර්යාලය,
අංක 28/1, නව නගරය,
රත්නපුර.

නඩු අංකය : ඒ/3400

ඉල්ලුම්කරු

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

වගඋත්තරකරු

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2011.07.16 වෙනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

දෙපාර්ශ්වය අතර පවතින කාර්මික ආරවුල මෙසේය.

"කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි වෙත ලබා දිය යුතු උසස්වීම් විධිමත් ආකාරයට ලබා නොදීම හේතුවෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණීන් වන,

01. VIII ශ්‍රේණියේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණීන් VII ශ්‍රේණියට උසස් කිරීමේදී ද,

02. VII ශ්‍රේණියේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණීන් VI ශ්‍රේණියට උසස් කිරීමේදී ද,

03. VI ශ්‍රේණියේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණීන් V අධි ශ්‍රේණියට උසස් කිරීමේදී ද යම් අගතියක් සිදු වූයේ යයි වෘත්තීය සමිතියේ ඉදිරිපත් කිරීම නිවැරදිද, නිවැරදි නම් ඔවුනට කුමන සහනයක් හිමිද," යන්න වේ.

මෙම ආරවුල 2012.12.01 වෙනි දින බේරුම්කරණයට කැඳවූ අවස්ථාවේදී රජයේ චක්‍ර ලේඛ 43:1 හා 2011.09.13 වෙනි දින දරන චක්‍ර ලේඛනය මගින් වැටුප් ප්‍රතිශෝධනයක් සිදු වූ බවද, ඒ අනුව සියලු සේවකයින්ගේ වැටුප් වැඩි වී ඇති බැවින් බේරුම්කරණයට ඉදිරිපත් වූ ආරවුල පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවයක් නැති බව වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් කරුණු දක්වමින් බේරුම්කරණයට දැනුම් දෙන ලදී. ඉහත චක්‍ර ලේඛනය පරිදි විෂමතා ඇති වූ සේවකයින් සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීම් සලකා බැලිය හැකි බවද, වැඩි දුරටත් වගඋත්තරකර පාර්ශ්වය බේරුම්කරණයට දැනුම් දෙන ලදී.

ඉහත කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා දෙපාර්ශ්වයටම බේරුම්කරණයෙන් දින ලබාගත් අතර, ඊට කාලයක් අවශ්‍ය බවද, බේරුම්කරණයට දැනුම් දෙන ලදී.

ඉහත ආරවුල සමථයකට පත් කර ගැනීම සඳහා කළමණාකාරීත්වය සමග ඉල්ලුම්කාර පාර්ශ්වය සාකච්ඡා කළ බැවින් අවශ්‍ය පරිදි බේරුම්කරණයේදී දින ලබා දෙන ලදී.

ඉල්ලුම්කාර වෘත්තීය සමිතිය සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් අධ්‍යක්ෂ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් පිළිබඳව දැනුම් දුන් බවත්, ඒ අනුව කටයුතු කිරීම සඳහාද, කාලයක් අවශ්‍ය බව බේරුම්කරණයට දෙපාර්ශ්වය විසින් දැනුම් දුන් අතර, ඒ අනුව කාලයක් ලබා දෙන ලදී.

ඉහත සාකච්ඡාවලින් පසුව මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ දෙපාර්තමේන්තුව ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් සලකා බැලීමෙන් අනතුරුව ඊට එකඟත්වය ලබා දුන් බවද, ඉල්ලුම්කාර පාර්ශ්වයේ ඉල්ලීම පරිදි විභාග නොපැවැත්වූ කාල පර්ච්ඡේදයට වලංගු වන පරිදි පෙර දාතම කර උසස්වීම් ලබා දීමට කටයුතු කර ගෙන ඇති බැවින් මෙම ආරවුල සමථයට පත් කිරීමට දෙපාර්ශ්වය 2013.12.10 වෙනි දින එකඟ බව දැනුම් දීමෙන් අනතුරුව නඩු ගොනුවට අත්සන් තබන ලදී.

ඉහත පරිදි දෙපාර්ශ්වයයේ එකඟත්වය මත ආරවුල සමථයට පත් කිරීම සාධාරණ හා යුක්ති සහගත වන හෙයින් මෙකී ආරවුල සමථයට පත් කරමි.

බේරුම්කරු.
(පාලිත වීරසේකර)

2014 පෙබරවාරි මස 18 වැනි දින.

05 - 380

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.